# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

# ඇබෑර්තු

## පරිපාලන කාර්ය මණ්ඩලය - ස්ථිර පදනම

### රත්මලාන පරිශ්‍රය

1. සහකාර ලේඛකාධිකාරී තනතුර
2. සහකාර ලේඛකාධිකාරී (නීති හා ලේඛන) තනතුර

### දක්ෂිණ මණ්ඩපය - සූරියවැව

3. සහකාර මූල්‍යාධිකාරී තනතුර

**වැටුප් පරිමාණ**

- **සහකාර ලේඛකාධිකාරී, සහකාර මූල්‍යාධිකාරී සහ සහකාර ලේඛකාධිකාරී (නීති හා ලේඛන) තනතුරු:-**

  U-EX I (II) Rs.50,625 - 3x1,125 - 54,000 (EB) 55,335; 12x1,335 - 71,355 p.m. + (Rs.17,800 ජීවන වියදම් දීමනාව + Rs.5,000 මාසික දීමනාව + 45% අනධ්‍යයන දීමනාව + 20% අමතර දීමනාව)

**බඳවා ගැනීමේ ක්‍රමවේදය**

අභියෝග්‍යතා පරීක්ෂණයක ප්‍රතිඵල මත පදනම්ව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් තෝරා ගැනීම සිදු කෙරේ.

**වෙනත් ප්‍රතිලාභ**

සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදල් සඳහා දායකත්වය, පාරිතෝෂික දීමනාව සඳහා හිමිකම, නොමිලේ ලබා දෙන සෞඛ්‍ය සහ ජීවිත රක්ෂණය, වාර්ෂික දිරි දීමනා, සේවකයින්ගේ දරුවන්ට ශිෂ්‍යත්ව, විශ්වවිද්‍යාලයීය රෝහලේ ප්‍රමුඛ ප්‍රතිකාර, සුබ සාධක ප්‍රවාහන සේවය සහ වෙනත් වරප්‍රසාද.

**පොදු කොන්දේසි**

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
2. අයදුම්කරුවන් තෝරා ගැනීම ඒ ඒ තනතුරෙහි අනුමත ඇබෑර්තු ගණන සම්පූර්ණ වනතෙක් පමණක් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලය විසින් සිදුකරනු ඇත.
3. අයදුම්කරුවන් විසින් වෙබ් අඩවියෙන් (www.kdu.ac.lk) භාගත කරගෙන තමා විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය අදාළ සහතික වල සහතික කළ ඡායා පිටපත් සහිතව **2024 සැප්තැම්බර් මස 23** වෙනි දිනට හෝ එදිනට පෙර ලේඛකාධිකාරී, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, රත්මලාන යන ලිපිනයට ලියාපදිංචි තැපෑල මගින් එවීම හෝ ගෙනවිත් භාර දීම කළ යුතුය.
4. ලියුම් කවරයේ ඉහළ වම්පස කෙලවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.
5. **අයදුම්කරුවන් එක් එක් තනතුර සඳහා අයදුම්පත් වෙන වෙනම ඉදිරිපත් කළ යුතුය.**
6. රජයේ දෙපාර්තමේන්තු/සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩල, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හා උසස් අධ්‍යාපන ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කරුවන් අදාළ ආයතන ප්‍රධානියා හරහා තම අයදුම්පත් යොමු කළ යුතුය.
7. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් (www.kdu.ac.lk) භාගත කරගත හැකි ආකෘතිය මගින් පමණක් අදාළ තනතුර සඳහා ඉල්ලුම් කරන ලෙස අයදුම්කරුවන්ට තරයේ දන්වා සිටිනු ලැබේ. ප්‍රමාදවී ලැබෙන, අසම්පූර්ණ හෝ නියමිත ආකෘතියට පරිභාහිරව එවනු ලබන අයදුම්පත් සහ ඉහත අංක 6 හි ලබාදී ඇති උපදෙස් අනුගමනය කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
8. අපේක්ෂකයින් අයදුම් කිරීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් අයදුම්පත් කැඳවා අවසන් වන දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.
9. අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා යොමු කරනු ඇත.
10. තෝරාගන්නා ලද අපේක්ෂකයින්ට මෙම විශ්වවිද්‍යාලයේ ඕනෑම පරිශ්‍රයක සේවය කිරීමට හා රාජකාරි කිරීමට හැකියාව තිබිය යුතුය.
11. අයදුම්කරුවන් තෝරාගැනීම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුකූලව සහ අභියෝග්‍යතා පරීක්ෂණයෙන් පසුව පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත සිදු කරනු ඇත.
12. අයදුම්කරුවන් අභියෝග්‍යතා පරීක්ෂණය සඳහා යොමු කිරීමට හා සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට පෙර ඔවුන් කෙටි ලැයිස්තුගත කිරීමේ අයිතිය විශ්වවිද්‍යාලයට ඇත.
13. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ආසන්නතම වැටුප් චක්‍රලේඛයන් අනුව වැටුප ගෙවනු ලබන අතර වැටුපට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද වෙනත් දීමනා ගෙවනු ලැබේ.
14. මෙම තනතුරු ස්ථිර අතර මෙම පත්වීම වසර තුනක (03) පරිවාස කාලයක් සඳහා යටත් වේ.
15. තනතුරට අදාළ සුදුසුකම් සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ සහ ඒවායේ විශේෂ සටහන් හා අදාළ සංශෝධන වෙත යොමු වෙන ලෙස අපේක්ෂකයින්ට උපදෙස් දෙනු ලැබේ.

- සහකාර ලේඛකාධිකාරී තනතුර } - වි.ප්‍ර.කො. චක්‍රලේඛ අංක. 15/2017
- සහකාර මූල්‍යාධිකාරී තනතුර }
- සහකාර ලේඛකාධිකාරී (නීති හා ලේඛන) තනතුර - වි.ප්‍ර.කො. චක්‍රලේඛ අංක. 948

**අයදුම්පත් එවිය යුතු ලිපිනය:**

**ලේඛකාධිකාරී,**
**ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය,**
**රත්මලාන 10390,**
**ශ්‍රී ලංකාව.**

**අවසාන දිනය**
**2024 සැප්තැම්බර් 23**

**වැඩි විස්තර සඳහා**
**පිවිසෙන්න**
**www.kdu.ac.lk**

©SELACINE